පානදුර ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාවනයකළමතය

පානදුර ප්‍රාදේශීය සභාවේ2024දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ10(1) උපවගන්තිය විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්කාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

1.2 ව්‍යාවනය කළ මතයසඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශනසම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශිය සභාවේමූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේවාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන

සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේමූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධ වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3වන පරිජේදයේ 3.7ජේදය ප්‍රකාරව අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	**පිළිතුරු ලබා දී නොමැත.**	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 6 වන පරිච්ජේදයේ 6.3 ජේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ගිණුම්ගත කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.266,798,885 ක් වූ වටිනාකම ඉඩම්, ගොඩනැගිලි වශයෙන් වෙන් වෙන්ව දක්වා නොතිබුණි.	2025වර්ෂයේ අවසන් ගිණුමට වෙන් වෙන්ව ඉදිරිපත් කිරීමට හැකි බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 6 වන පරිච්ජේදයේ 6.15 ජේදය ප්‍රකාරව වත්කමේ අනාගත ආර්ථිකප්‍රතිලාභ පරිභෝජනයකිරීමට හා එම අපේක්ෂිත රටාව පිළිබිඹු වන ක්ෂය කිරීමේ ක්‍රමයක් තෝරාගෙන ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හැර අනෙකුත්දේපල පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි.	2025වර්ෂයේ සිට ක්ෂය ප්‍රතිපත්තියට අනුව ක්ෂය කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් 2023 වර්ෂය දක්වා අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගෙන නොතිබුණු ප්‍රාග්ධන ශේෂයත්,2024 වර්ෂය තුල ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමත්, සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගන්නා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමත්, සමාලෝචිත වර්ෂය අවසන් දිනට අතිරික්තයටහෝ ඌනතාවයට හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමත් ආදී විස්තර ඇතුලත් විය යුතුමූල්‍යප්‍රකාශනවලට වූ සටහන් අංක 10 පිළියෙළ කර නොතිබුණු අතර, මේ නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයහාවෙනත් විස්තීර්ණ ආදායම නිවැරදිව නිරූපනය වී නොතිබුණි.	2025වසරේදී මෙම වාර්ථාවත් සකස් කර ගැලපීම සිදුකිරීමට නියමිත බව.	මූල්‍ය ප්‍රකාශන වලට සටහන් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේආරම්භක දිනවනවිට අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගෙන නොමැති ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් ප්‍රවර්ථන වර්ෂයේ ආදායම සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක5 හි අගය හඳුනාගත යුතු වුවද ,එසේ හඳුනාගෙන තිබූ රු.13,190,177ක අගය නිවැරදි නොවන අතර , වෙනත් විස්තීර්ණ ආදායම යටතේ ප්‍රවර්ථන වර්ෂයේ ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ද ගැලපීම් කර නොතිබුණි.	2025වර්ෂයේ අවසාන ගිණුමට ගැලපීම කරනබව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2021 වර්ෂයේ රු.81,000,000ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදීඑය රු.80,000,000 ක් ලෙසරු.1,000,000 ක් අඩුවෙන් දක්වා තිබීම නිවැරදි කර නොතිබුණි.	2025 අවසාන ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2024දෙසැම්බර් 31දිනට ලැබිය යුතු මස්කඩ කුලි ශේෂය රු.2,286,896ක් ලෙස උපලේඛණයේ දක්වා ඇතත් 2024දෙසැම්බර්31දිනට වත්කම් වගකීම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී එම අයිතමය මග හැරී තිබුණි.	2025වර්ෂයේ අවසන් ගිණුම තුල ගිණුම් ගත කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	දේශීය ණය සංවර්ධන අරමුදලින් කෙසෙල්වත්ත නව පොදු වෙළඳපල ඉදි කිරීම සඳහා තෙවන ණය වාරිකය මුදල ලෙස රු.2,855,300ක්2024ජුනි 20දින මහජන බැංකුවේ ගිණුමක තැන්පත් කර ඇති බව දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂකගේ 2024ජුලි 15 දිනැති අංක LLDF/PS0075/00012/2020/00007 දරණ ලිපිය අනුව දන්වා ඇති නමුත් මේ සම්බන්ධව ලදුපතක සටහන් කිරීමක් කර ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.	2025වර්ෂය සඳහා වූ ගිණුම්තුල ගිණුම් ගත කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	සියලු ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට වූ දේපල පිරියත හා උපකරණ සටහනේ දැක්විය යුතු වුවද , ගොඩනැගිලි ,මංමාවත් ,බෝක්කු ,පාලම් , කාර්යාල උපකරණ ,බදුන් හා උපකරණ එපරිදි දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 11 කට අදාල ශේෂය එයට අදාල උපලේඛනය සමඟ සැසඳීමේදී රු. 758,599,799 ක වෙනසක් නිරීක්ෂණය විය.	2025අවසන් ගිණුම සකස් කිරීමේදී උපලේඛන හා සසඳා නිවැරදි කර ඉදිරිපත් කරන බව.	වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
සත්‍යාක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.235,262,582ක් වූ ගිණුම් විෂයයන් 11ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	2025වර්ෂයේඅවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී උපලේඛන නිවැරදිව ඉදිරිපත් කරන බව.	ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

	නීති රෙගුලාසි ආදීයට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	(අ) 1987 අංක 15දරණ ප්‍රාදේශීය සභා පනත			
(i)	149 වගන්තිය	සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා යම් හෝටලයක් ,ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක වර්ෂයේ සම්පූර්ණ ආදායමින් සියයට එකක් දක්වා මුදලක් අයකළ යුතු වුවත් සංචාරක හෝටලයකින් 2018වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ආදායම් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.	එම මුදල් අයකිරීම සඳහා පානදුර දිසා අධිකරණයේ අංක 66829/2019 යටතේ නඩු පවරා ඇති අතර මේ දක්වා එම නඩුව විභාග වෙමින් පවතින බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	160 වගන්තිය	හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් කර නොතිබුණි.	හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා අවස්ථා 12කදි දේපල තහනම් කිරීමට ක්‍රියාකර ඇති බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.284,988,769ක් වූ අතර ඊට අනුරූපීවඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 76,769,142ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරුඅනුවසමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳතොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තු ගත ආදායම	2024 බිල් කළ ආදායම	2024 රැස් කළ ආදායම	2024 දෙසැම්බර් 31 දිනට හිඟය	2023 ඇස්තමේන්තු ගත ආදායම	2023 බිල් කළ ආදායම	2023 රැස් කළ ආදායම	2023 දෙසැම්බර් 31දිනට හිඟය
		රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
i	වරිපනම් හා බදු	30,000	28,803	116,136	12,670	29,182	29,269	31,053	38,577
ii	කුලි	6,800	3,846	3,702	143	413	2,238	4,376	2,300
iii	බලපත්‍ර ගාස්තු	480	511	511	-	634	488	519	45
iv	වෙනත් ආදායම්	12,003	12,044	9,791	2,253	13,270	10,584	10,573	55
	එකතුව	**49,283**	**45,204**	**30,140**	**15,066**	**43,499**	**42,579**	**46,521**	**40,977**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රගතිවාර්තාව අනුව 2024ජනවාරි 01දිනට සමස්ථහිඟ වරිපනම් හා බදු ආදායම රු.38,576,875ක් වූ අතර 2024 දෙසැම්බර්31දින වන විට ඉන් රු.21,331,953ක් හෙවත් සියයට 55ක් අයකරගෙන නොතිබුණි.	මේ වන විට රු.4,400,000ක් අයකර ඇති බවත්,එය සියයට 20.62ක් බව.	හිඟ ආදායම් කඩිනමින්අයකරගත යුතුය.
(ආ)	ප්‍රගති වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික බිල් කිරීම රු.28,805,578 වු අතර එම බිල් කිරීමෙන් රු.12,669,764 හෙවත් සියයට 44ක් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු.50,000ක් ඉක්මවූ වරිපනම් ඒකක 13කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.1,782,813 විය.	හිඟ මුදලින් මේ වන විට සියයට 31.57ක ප්‍රතිශතයක් අය කර ඇති බවත් එය රු.50,000 ඉක්මවූ වරිපනම් ඒකක 8 කින් රු.1,366,961 ක් අයකර ගෙන ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඇ)	වාර්ෂිකව ටෙන්ඩර් මත බදුදෙන දේපලවලින්2024 වර්ෂය සඳහා බිල්කළ ආදායම රු.9,800,650ක් වුවද ඉන් රු.2,253,473ක් හෙවත් සියයට 23 ක් වර්ෂය තුළ අයකර ගැනීමට සභාව අපොහොසත්වී තිබුණි.	අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරමින් පවතින බව .	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඈ)	2024 ජනවාරි 01 දිනට පැවති රු.33,423ක් වූ සම්මුච්ත හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට දේපල දෙකකින් අයවිය යුතු මුළු හිඟ ශේෂය රු.2,286,896 ක් විය.	2025වර්ෂය තුල අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග යොදනබවත්,ඉතිරි රු.2,253,473ක මුදල අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවිය යුතු වෙළඳ ස්ථාන කුලී ආදායම රු.2,299,534ක් වූ අතර,ඉන් රු.1,817,300 ක් හෙවත් සියයට 79ක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි.	රු.1,383,900 ක් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇතිබව හා කෙසෙල් වත්තපොදු වෙළඳපොලේ කඩවලට අදාලව රු.401,850ක හිඟ මුදලක් ද අයකර ගැනීමට නොහැකි තත්වයක් ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඊ)	කඩ කුලි සඳහා ලබා දී තිබුණු උපලේඛනය අනුව ආරම්භක හිඟ ශේෂ වටිනාකම හා වර්ෂයේ බිල් කළ වටිනාකම යන අගයන් දෙකෙහි එකතුව වර්ෂයේ එකතු කළ යුතු කඩ කුලි ආදායම විය යුතු වුවද, එම අගයට වඩා වැඩි අගයක් වර්ෂයේ එකතු කළ ආදායම ලෙස සටහන් කර තිබීම හේතුවෙන්එම උපලේඛනයේ නිවැරදිභාවය පිළිබඳව විගණනයට ගැටළු සහගත විය.	ගිණුම්ගත නොවූරු.110,800 ක වෙළඳ ස්ථාන කුලී ගිණුම්ගත කරන බව.	උපලේඛන නිවැරදිව පවත්වාගෙන යා යුතු අතර, ලෙජර් ගිණුම සමඟ සැසඳීම අධික්ෂණය කළ යුතුය.
(උ)	2023වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව උසාවි දඩ සඳහා ලැබිය යුතු අගය රු.27,097,216ක් වූ අතර උපලේඛන අනුව එයරු.15,232,576ක් විය. 2024 වර්ෂයේදි 2023වර්ෂය වෙනුවෙන් ලැබි තිබූ වටිනාකම රු.15,189,368ක් විය.	2025 වර්ෂයේ අවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී මෙය නිවැරදි කර ඉදිරිපත් කරන බව .	ආදායම නිවැරදිව හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කායර්යන්

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම**		
	ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් 2024වර්ෂය තුලදීලැබි තිබුණු අයදුම්පත් අතරින්අනුමත කළ සංඛ්‍යාව2024දෙසැම්බර් 31දින වන විටත්නේවාසික හා ව්‍යාපාරික වශයෙන් පිළිවෙලින් සැලසුම් 309ක්අතුරින් සැලසුම් 59ක් හා සැලසුම් 26ක්අතුරින් සැලසුම් 8 ක් පමණක් විය.2024දෙසැම්බර් 31දිනට අනුකූලතා සහතික ලබා දුන් සංඛ්‍යාව නේවාසික 28ක් හා ව්‍යාපාරික 01ක් විය.	නේවාසික ගොඩනැගිලි අයදුම්පත් 36ක්ද මේ වන විට අනුමත වී ඇති බව.	කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) **පාරිසරික ගැටලු**

දිග්ගල පාරේ ආරම්භක ස්ථානයේ ඇති කාණුව මිරියවත්ත ගම්පත පාර ඔස්සේ ගහ දක්වා දිග්ගල පාර හරහා ගමන් කරන අතර ,දිග්ගල පාර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් විය .මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i)	2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථා සංශෝධිතපනතින් සහ 1982අංක 52දරණ පනතින් හා 1976අංක 27 දරණ නීතියෙන් සංශෝධිත 1968අංක 15දරණශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ)1 වගන්තිය මගින් පෙන්වා ඇති පරිදි මෙම කාණුව දෙපසින් රක්ෂිත තබා නොමැති අතර ඇළ මායිම දක්වාම අනවසර ඉදිකිරීම් කර තිබුණි .එම නිවෙස්වල මළමුත්‍රා සහ අනෙකුත් අපවිත්‍ර සහිත නල මාර්ග මෙම ඇළට මුදාහැර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ,මේ හේතුවෙන් ඇළෙහි ජලය දූෂණය වී ද තිබුණි.	අනවසර ඉදිකිරීම් කරුවන්ට හා ඇල අපවිත්‍ර කටයුතු සිදුකරන පුද්ගලයන් සඳහා නියෝග නිකුත් කිරීමටත් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමටත් බලාපොරොත්තුවන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	දිග්ගල පාරෙහි ඇති කාණුව ස්වභාවික ගලන මාර්ගය වෙනස් කොට පුද්ගලික ආයතනයක් හරහා ගලා බසින ආකාරයට සකසන පද්දක් බව නිරික්ෂණය විය. එමෙන්ම වර්ෂා කාලයට මෙම ඇළ මාර්ගයේ ජලය බැස යාම අවහිර වී මාර්ගයෙන්පිටතට ජලය පිටාර ගැලීමක් සිදුවන බවත්, එමගින් අසල්වැසි ජනතාව පීඩනයට පත්ව තිබෙන බවත් නිරීක්ෂණය විය.	ඉදිරියේදී මෙම කාණුවෙන් ජලය පිටතට ගලායැම පාලනයට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ) **අත්හැර දැමූ කර්තව්‍යන්**

(i)	1998 වර්ෂයේ සිට වර්ෂ 25ක කාලයක් පවතින ජල ප්‍රවාහන ගැටළුවක් විසඳීමසඳහා ආරම්භ කළ දිබ්බැද්ද පුඤ්ඤානන්ද මාවතේ කජුගහවත්ත ඉඩමට මායිම් වන රජයේ ඉඩමේ පොදු කාණුව ඉදිකර වැසි ජලය බැස යාමට සැලැස්වීමේ ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික ඉඩමක් හරහා දිවයනකාණු කොටස පමණක් රු.253,577 ක් සහා අරමුදලින් වැයකර ඉදිකර, ව්‍යාපෘතිය අතරමග අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් මාර්ගයේ කාණුවකින් වැසි ජලය පෞද්ගලික ඉඩම් තුළට ගලායෑමෙන් වන හානියට අමතරව වැසි ජලය බැස නොයෑමෙන් මාර්ගයද පරිහරණය කළ නොහැකි වි තිබුණි.	කාණුව සඳහා බිම් තීරුව අත්පත් කර ගැනීමට අවශ්‍යය කටයුතු සිදුකරගෙන යනු ලබන අතරමේ සඳහා රු.852,000ක මුදලක් පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇති බව.	ව්‍යාපෘතියඅවසන් කර ගැළුවට විසඳුම් ලබාදීමට කටයුතු කළ යුතුය.
(ii)	කෙසෙල්වත්ත පොදු වෙළඳපල පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින්	පානදුර ප්‍රාදේශීය සභාවේ නව සභාව මගින් අනුමැතියලබාගෙන	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු නැවත

2021සැප්තැම්බර් 27 වන දින රු.20,000,000ක් ලැබී තිබුණු අතර සෑම මසකම එම ණය මුදල සඳහා පොළී මුදල ලෙස රු.150,000ක් ගෙවිය යුතුව තිබුණි .ලබා දී තිබුණු සහන කාලය අවුරුදු 01මාස 7ක් වූ අතරසහන කාලය අවසානයේ වාරික මුදල ගෙවිය යුතු විය. 2022අප්‍රේල් 26 දින තවත් රු.4,231,000ක ණය මුදලක් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබී තිබූ අතර අප්‍රේල් මාසය වෙනුවෙන් රු.4,173.04 ක් ද මැයි මාසයේ සිට ගෙවිය යුතු වූ පොළී මුදල රු.181,732.50ක් ද විය. 2024 ජුනි 19 දින තෙවන ණය වාරිකය ලෙස රු.2.855,300ක් සභාවට ලැබීතිබුණු අතර, 2024 ජූලි මස සිට රු.401,734.23ක් මසකට ගෙවිය යුතු විය. කෙසෙල්වත්ත පොදු වෙළඳපල නවීකරණය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලැබී තිබූ රු.20,000,000 ක් වූ සම්පූර්ණ මුදල එහි ගිවිසුම් ගත මුදල වූ රු.105,094,983කින් සියයට 20 කට සමාන අත්තිකාරම් මුදලක් ලබාදීතිබුණදමේ වන විටත් එහි කටයුතු අතරමග නවතා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් ද සිදු කර නොතිබුණි.	නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීමට නියමිත බව.	ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31දිනැති අංක 2018/4දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනණය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01දිනැති අංක LGD/10A/4/න.ගි2019/දරණ ලිපිය අනුව දන්වා ඇතත් ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේදී ඇතැම් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	සභා බල ප්‍රදේශයේ තිබෙන දැන්වීම් පුවරු සඳහාආදායම් පරික්ෂකවරුන් මඟින් දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ගැනීමකින් තොරතුරු රැස්කරගෙන දත්ත පද්ධතියක් පිළියෙල කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2025වර්ෂයේදී දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකරමින් පවතින අතර ඒ අනුව දත්ත පද්ධතියක් පිළියෙල කරගැනීමට කටයුතු කරන බව.	දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් හා දත්ත පද්ධතියක් පිළියෙල කළ යුතුය.

(ඇ)	මූලාා ප්‍රකාශනවලටවූ සටහන 16 හි රු.40,862,885 ක් වූ ගොඩනැගිලි එකතු කිරීම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතරරු.36,222,383ක් සඳහා පමණක් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීම සිදුකර තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කළ යුතුය.
(ඈ)	ලී බඩු හා යන්ත්‍රෝපකරණවල රු.71,124,664ක වටිනාකම දැක්වෙන උපලේඛණයක් විගණනයට ඉදිරිපත් කර තිබුණද ලී බඩු, යන්ත්‍ර, උපකරණ වෙන් වෙන් වශයෙන් දැක්වෙන පරිදි උපලේඛන පිළියෙළ කර නොතිබුණි.	2025අවසන් ගිණුම් තුලින් නිවැරදිව ඉදිරිපත් කරන බව.	සියලුම වත්කම්වලට වෙන වෙනම උපලේඛන පිළියෙල කළ යුතුය.
(ඉ)	"උඩුගහපසතුව පාර" වශයෙන් මාර්ගය දෙකළවරෙහි නාමපුවරු දෙකක් සවිකල මාර්ගය 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය අනුව සභාවේ මාර්ග ලේඛනය ඇතුළත් කර නොතිබුණි.	ගැසට් කිරීමෙන් අනතුරුව මෙම නාමය මාර්ග ලේඛනයට ඇතුලත් කිරිමට කටයුතු කරන බව	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024දෙසැම්බර් 31දින වන විට සභාව සතු වාහන 05ක් ධාවන තත්ත්වයේ නොමැති අතර, වාහන 10 ක් අපහරණයට හඳුනාගෙන ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණය කිරීම සිදුකර නොතිබුණි.	දැනට අපහරණයට හඳුනාගත් වාහන 10ට තක්සේරු මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජිත අතර ධාවන තත්වයේ නොමැති වාහන 05 අතරින් ට්‍රැක්ටරයක් පමණක් අළුත්වැඩියාව කළ යුතු බව.	ධාවන තත්වයේ නොමැති හා අළුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුමත සේවක සංඛ්‍යාවට අමතරව ආදේශක,කොන්ත්‍රාත් හා ශ්‍රම පදනම මත පිළිවෙලින් සේවකයින් 02ක් 01ක්සහ 31 ක් බඳවාගෙන තිබූ අතරවර්ෂය තුලදී සභා අරමුදලින් වැටුප් ලෙස රු .15,075,059 ක මුදලක් ගෙවා තිබුණි.	මේ වන විට ආදේශක සේවකයින් දෙදෙනෙකු භාශ්‍රම පදනම යටතේ සේවකින් 31ක් පමණක් සේවයේ යොදවා ඇති බව.	අනුමත කාර්‍ය මණ්ඩලයක් සංශෝධනය කර අනුමත කරවා ගත යුතුය.

(ආ)	ස්ථාන මාරු වි ගිය නිලධාරින් 8 දෙනෙකුගෙන් රු.1,369,127ක්ද, විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් රු.788,324 ක්ද වැඩ තහනම් කළ නිලධාරියකුගෙන් රු.192,165ක් ද සේවය හැර ගියනිලධාරින් 4 දෙනෙකුගෙන් රු.236,185ක් ද 2024 දෙසැම්බර් වන විට අයකර ගෙන නොතිබුණි.	ස්ථාන මාරුවී ගිය නිලධාරින් 3දෙනෙකුගෙන් රු.715,602ක මුදලක් හා විශ්‍රම ගිය එක් එක් නිලධාරියෙක්ගෙන්රු.158,150ක්2025 මැයි 30 වන විට අයකර ඇති අතර ස්ථාන මාරුවී ගිය ඉතිරි නිලධාරින් 5දෙනාගෙන් ණය මාසික වාරික වශයෙන් අය කරන බව .	හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ස්ථාන මාරු වි පැමිණි නිළධාරීන්ගේ ණය ශේෂ අදාල ආයතන වෙත එකවර පියවිය යුතු වුවත් සභාවෙන් ස්ථාන මාරු වි ගිය සේවකයන් 09 දෙනෙකුගෙන් එකතුව රු.1,414,491ක ණය ශේෂයක් පියවා නොතිබුණි.	ස්ථාන මාරුවී වී පැමිණි නිලධාරින් සියලු දෙනාගේ ණය ශේෂ මේ වන විට පියවා අවසන් බව .	හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවේ 2024 වසරේ අයවැය ලේඛනය මගින් පුනරාවර්තන නොවන වියදම් සඳහා රු.55,100,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සත්‍ය වශයෙන් දරා තිබූ වියදම රු.51,934,622ක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය.